# කෝට්ටේ යුගයේ රචිත සන්දේශ කාව්‍යය තුළින් හෙළිවන සාම්ප්‍රදායික බෞද්ධ අධ්‍යාපනයෙන් නිරූපිත ගුරුසිසු භූමිකා හා විෂයනිර්දේශ

ඩබ්ලිව්.කේ.ඩී. කීර්තිරත්න

## හැඳින්වීම

ශ්‍රී ලාංකීය බෞද්ධ අධ්‍යාපනයට දිගු ඉතිහාසයක් ඇත. එහි ආරම්භය අනුරාධපුර යුගයේ මහා විහාරය දක්වා දිව යයි. මෙම සාම්ප්‍රදායික බෞද්ධ අධ්‍යාපනයේ ගමන් මඟ වරින් වර උන්නතියටත් අවනතියටත් පත් ව මේ දක්වා විකාශනය වි ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වනුයේ ශ්‍රී ලාංකීය පද්‍ය සාහිත්‍ය ඉතිහාසයේ ස්වර්ණමය යුගය සේ සැලකෙන කෝට්ටේ යුගයේ පැවති සාම්ප්‍රදායික බෞද්ධ අධ්‍යාපනයේ නිරූපිත ගුරුභූමිකාව හා විෂය නිර්දේශ පිළිබඳ එකල ලියැවුණු සන්දේශ කාව්‍යය ඇසුරින් සොයා බැලීම වේ. පර්යේෂණ කාර්යයේ දී කෝට්ටේ යුගයේ රචනා වූ පරෙවි, සැළලිහිණි, ගිරා, කෝකිල සහ හංස යන සන්දේශ කාව්‍යය ප්‍රාථමික මූලාශ්‍රය ලෙසත් පසු කාලීන ව සාම්ප්‍රදායික බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ ලියැවී ඇති පොත් පත් හා පර්යේෂණ පත්‍රිකා ද්විතීයික මූලාශ්‍රය ලෙසත් පරිශීලනය කොට ඇත. මෙකී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඇසුරින් ලබාගත් තොරතුරු විමර්ශනාත්මක ව අධ්‍යයනය කොට ඇත. කෝට්ටේ යුගයේ පැවති අධ්‍යාපන ආයතන අතුරින් සන්දේශ කාව්‍යයවල වැඩි වශයෙන් විස්තර කරන්නේ කැරගල පද්මාවති පිරිවෙණ හා තොටගමුවේ විජය බා පිරිවෙණ පිළිබඳ ව පමණි. එහෙයින් මෙම පර්යේෂණ පත්‍රිකාවේ දී එම ආයතන දෙක පිළිබඳ ව පමණක් වැඩි අවධානයක් යොමු කෙරේ.

## සාහිත්‍යය විමර්ශනය

කෝට්ටේ යුගය පිරිවෙන් අධ්‍යාපන කටයුතුවල විශිෂ්ටතම ප්‍රගතියක් පෙන්නුම් කරන ලද අතර උභය වාසයට අයත් මෙම පිරිවෙන් තුළ පැන නැගුණු තරගකාරී ස්වභාවයට රජවරුන්ගෙන් ලද නොමද අනුග්‍රහය බෙහෙවින් බල පා ඇත (අධිකාරි, 1991). මෙහි උභය වාසය යනු ග්‍රන්ථ ධුරය හා විදර්ශනා ධුරය යි. වනගත පෙදෙසක භාවනා වැඩූ භික්ෂූන් විදර්ශනා ධුරයටත්, ග්‍රාම වාසී ව ත්‍රිපිටකය ඉගෙනීම, ඉගැන්වීම හා දේශනා කිරීම කළ භික්ෂූන් ග්‍රන්ථ ධුරයටත් අයත් වූහ (රාහුල, 1956). එකොළොස්වන සියවසේ ආරම්භ වූ විජයබා පිරිවෙණ ග්‍රාමවාසයට ද පද්මාවතී

පිරිවෙණ වන ජීවන වාසයට ද අයත් කෙරේ. 12, 13, 14 සියවස්වල වරින් වර පුනරුත්ථාපනය වෙමින් 15 16 සියවස්වල විශ්ව කීර්තියට පත් තොටගමුවේ විජයබා පිරිවෙණ අග්‍රගණ්‍ය ශාස්ත්‍රායතනයක් සේ පිළිගැනෙයි (**අධිකාරි, 1991**). තොටගමුවේ විජයබා පිරිවෙණ 18 වන සියවසේ යුරෝපයේ පැවති දියුණු විශ්වවිද්‍යාලයක තත්වයෙන් පවත්වාගෙන ගිය ශාස්ත්‍රාලයකි (**පුඤ්ඤසාර, 1992**). කෝට්ටේ යුගය තොටගමුවේ විජයබා පිරිවෙණෙහි ස්වර්ණමය යුගය වේ(එම). තොටගමුවේ විජයබා පිරිවෙණෙහි උගන්වා ඇති විෂයපථය පොදු ජනයා පිළිගත් දෛනික පැවැත්මට උපයෝගී වූ ජීවන රටාව පිළිබිඹු කරන එකක් විය (**මැන්දිස්, 1981**). මේ අතර වනවාසයට අයත් සමහර පිරිවෙන්වල ලෞකික විෂයන්ට කිසිදු ඉඩක් නො වූ අතර සමහර ඒවායේ පැවිද්දන්ගේ ප්‍රායෝගික පුහුණුවට එකඟ සම්ප්‍රදායානුකූල සම්මත විෂය පද්ධතියක් උගන්වා ඇත. එ පමණක් නො ව සසුන් කෙත හෙබවීමේ අරමුණින් සුවිශේෂී පුහුණුවක් ලබාදුන් එ මෙන් ම පැන වූ විනයනය අකුරට ම ක්‍රියාත්මක කළ මාහිමිවරුන් තම පිළිවෙත සැබෑ ශාසනානුලෝමික ක්‍රමය බව ප්‍රසිද්ධියේ කියූ අවස්ථා ද ඇත (**අධිකාරි, 1991**). සන්දේශ කාව්‍යයවල සඳහන් බෙන්තොට වනවාසය 13 සියවසේ ප්‍රසිද්ධයට පත් ව තිබූ ආයතනයකි. පැපිළියානේ සුනේත්‍රාදේවී පිරිවෙණ ත්‍රිපිටකය, අටුවා, ටිකා ග්‍රන්ථකරණයට මුල් තැනැක් දුන් ආයතනයකි. ඉරුගල් කුලතිලතක පිරිවෙණ උභය වාසී මහ සඟණ තෙවළා දහම් ප්‍රගුණ කළ ගලතුරුමුලට අයත් කේන්ද්‍රස්ථානයකි (එම).

## කෝට්ටේ යුගයේ සාම්ප්‍රදායික බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන

පරෙවි, සැළලිහිණි, ගිරා, කෝකිල සහ හංස යන සන්දේශ කාව්‍යය කෝට්ටේ යුගයේ පැවති බෞද්ධ අධ්‍යාපන ආයතන ගණනාවක් පිළිබඳ තොරතුරු හෙළි කරයි. කැරගල පද්මාවති පිරිවෙණ, තොටගමුවේ විජයබා පිරිවෙණ, ඉරුගල් කුලතිලතක පිරිවෙණ හා පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙණ යනු එම බෞද්ධ අධ්‍යාපන ආයතන වේ. තොටගමුවේ විජයබා පිරිවෙණ ගාලු දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ හික්කඩුවට නුදුරින් මාදම්පා ඔය තෙල්වත්ත ග්‍රාමයෙහි පිහිටියකි. 19 වන සියවසේ මැද භාගයට පෙර මෙම පිරිවෙණ ඉතා ජනප්‍රිය අධ්‍යාපන මධ්‍යස්ථානයක් ව පැවතී ඇත. මෙහි ඉතිහාසය සොයන ඇතමෙක් පවසන්නේ තොටගමුවේ විජයබා පිරිවෙණ අනුරාධපුර යුගයට අයත් වන අතර පසු ව පළමුවන විජයබාහු රජු(1326) පස්මහලක් ව කර වූ බව ය. පරාක්‍රමබාහු රජු (1302) විසින් මෙය දෙ මහල් කොට තනා ඇත.

කැරගල පද්මාවතී විහාරය ඉදි කිරීමේ ගෞරවය හිමිවන්නේ දඹදෙණි රජ සමයේ විසූ IV විජයබා රජුටය (1270-1272). නමුත් මෙම විහාරය පිරිවෙණක් දක්වා සංවර්ධනය කරන ලද්දේ VI පරාක්‍රමබාහු රජුය (1415-1468). ඒ පද්මාවති බිසවට වැඳුම් පිදුම් කිරීම සඳහා ය.

හංස සන්දේශ කතුවරයා කැරගල පිරිවෙන් විහාරස්ථානය දිව්‍ය විමානයක සිරි ගත් බව කියයි (**හංස සංදේශය, 157**). මෙහි අතිශයෝක්තියක් ඇතැයි උපකල්පනය කළද මින් තහවුරු වන්නේ කැරගල පද්මාවතී පිරිවෙණ සැඟවුණු විෂයමාලාව

(අවිධිමත් විෂයමාලාව) ශක්තිමත් ව ස්ථාපිත කළ අධ්‍යාපන මධ්‍යස්ථානයක් වූ බව යි. වර්තමාන අධයාපනඥයන්ට අනුව පාසල ළමයා ජීවිතයේ පිළිවෙළ ඉගෙන ගන්නා එක් තැනකි. පාසල හෝ අධ්‍යාපන ආයතනය ක්‍රමානුකූල සංවිධානය වූවක් නම් ඔහු/ඇය තම පෞද්ගලික ජීවිතය ද නිවසේ වටපිටාව ද ඒ අනුව සංවිධානය කර ගනියි. මෙනයින් කැරගල පද්මාවතී පිරිවෙණ වත්මන් අධ්‍යාපන පද්ධතියට ද කිසියම් ආකෘතියක් සපයන බව පෙනේ.

### ගුරු සිසු භූමිකා

ගුරුවරුන් නො සලකා හරිමින් ගුරු ගෞරවයට හානි කරන වත්මන් පාසල් පද්ධතියෙහි වෙසෙන ඇතැම් දරුවන්ට කැරගල පද්මාවතී පිරිවෙණෙහි අධ්‍යාපනය ලැබූ සිසුන් මහත් ආදර්ශයකි. එම සිසුන් තුළ මනා ආකල්ප සංවර්ධනයක් සිදු වීමට හේතුව වන්නට ඇත්තේ ඔවුන්ට ශිෂ්‍යය විනය ගොඩ නැඟීමට පාදක වන මූල ශික්ෂාව හා සිඛ වළද විනිස වැනි විනය කරුණු ඉගැන්වීම යැයි උපකල්පනය කිරීම සාවද්‍ය නො වේ. තොටගමුවේ විජයබා පිරිවෙනෙහි පැවිදි ගිහි දෙපිරිස ම විසූ බවත් ඔවුන් ගුරු ගෞරවය ඉතා ඉහළින් අගය කළ බවත් ගිරා සන්දේශ කතුවරයා කියයි (**ගිරා සංදේශය**, 242). ඔහු දක්වන ආකාරයට බමුණෝ ද මෙම පිරිවෙන්වල ශිල්ප ශාස්ත්‍රය හැදෑරූහ (**ගිරා සංදේශය**, 223). ශාස්ත්‍රීය අධ්‍යාපනයට පමණක් මූලිකත්වය දෙමින් විනය හා ආකල්ප සංවර්ධනය නො සලකා හරිමින් ක්‍රියත්මක වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් පවතින වර්තමාන අධ්‍යාපන පද්ධතියට කැරගල පිරිවෙණෙහි කළමනාකරණ ක්‍රියාවලියෙන් ගතහැකි උදාහරණ බොහෝ ය (**හංස සංදේශය**, 157). පුරාණ ආචාර්යවරුන්ට ගරු කිරීම මෙම පිරිවෙනේ අධ්‍යාපන ක්‍රමයෙහි සුවිශේෂී ලක්ෂණයක් වී තිබුණි. පුරාණ ආචාර්යවරුන් විසින් ප්‍රකාශ කරන ලද දෙය යහපත් නම් ඒවා රැකගෙන ඉදිරියට යන අධ්‍යාපන ක්‍රමයක් ගොඩනැඟීම පැරණි අධ්‍යාපන ක්‍රමයෙහි ලක්ෂණයක් වූ බව හංස සන්දේශය සනාථ කරයි. බිහි වන නව සම්ප්‍රදායන්ට ගරු කරමින් පැරණි දේ ආරක්ෂා කිරීමට අවැසි නිසි කැප කිරීම් නොකොට ගොඩනගන වර්තමාන අධ්‍යාපන රටාව පිළිබඳ නැවත සිතා බැලීමට මෙමගින් කිසියම් ආදර්ශයක් සපයයි. වැරදි නම් පැරණි ආචාර්යවාද වුව ද ප්‍රතික්ෂේප කිරීම වරදක් නො වන බව වනරතන හිමියන් විසින් පුරාණ ග්‍රන්ථ ප්‍රතික්ෂේප කිරීමෙන් තහවුරු වේ (**හංස සංදේශය**, 157). අනෙක් අතට, එළදායි නම් කාල භේදයක් නොමැතිව එකී පැරණි මතවාද වුව ද පිළිගෙන ඉදිරියට රැගෙන යාම වරදක් නො වේ. නිර්මාපි ඉගෙනුම යනු අතීත අත්දැකීම් හා වර්තමාන අත් දැකීම්වල එකතුවකි. එනම් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයේ දී ශිෂ්‍යයා දැනුම ගොඩනගන්නේ තමන් ලබා ඇති අතීත අත් දැකීම් වර්තමාන අත් දැකීම්ව හා ගළපාලමින් ය. තොටගමුවේ විජයබා පිරිවෙණ හා කැරගල පද්මාවතී පිරිවෙණ ඒ අයුරින් පැරණි මතවාදන් නව මතවාදන් සංකලනය කොට නවතම ස්වරූපයකින් ගොඩ නැගුණු ගුරුකුල දෙකකට නෑ කම් කියන අධ්‍යාපන මධ්‍යස්ථාන දෙකකි.

වනරතන හිමි භාෂා ඥාණයෙන් පරතෙරට පැමිණියෙකි. අභිධර්මය අතේ තිබෙන මැණිකක් මෙන් දැන සිටියහ. විනය පිටකයෙහි නිපුණයෙකි. විනය

නැමැති සමුද්‍රයෙහි උන් වහන්සේගේ ඥාණය නැමති තිමිංගල මත්ස්‍යයා ක්‍රීඩා නො කළ තැනැක් නැත. සූත්‍ර පිටකය තවත් අයෙකුට අවබෝධ කරගත හැක්කේ උන් වහන්සේ දේශනා කරනු ලබන විටක දී පමණි. හංස සංදේශ කතුවරයා ගුරුවරයෙකු විසින් තම විෂය ක්ෂෙස්ත්‍රයට අදාළ දැනුම ගොඩනගා ගත යුත්තේ කෙසේද යන්නට ආදර්ශනයක් වනරතන හිමියන්ගේ ගුරු භූමිකාව ඇසුරින් පෙන්වාදෙයි (**හංස සන්දේශය**, 189).

ගුරුවරයා මෘදුකුසලතා ඇත්තෙකු විය යුතුවාක් මෙන් ම ශිෂ්‍යයා ද මෘදු කුසලතාවලින් පොහොසත් විය යුතු ය යන්න වර්තමාන අධ්‍යාපන ක්‍රියාවලියෙන් අපේක්ෂා කෙරෙන්නකි. සුහුරු පන්ති කාමර නිර්මාණය කිරීමට ගුරුවරයා පොළඹවන්නේ එහෙයිනි. කැරගල පද්මාවතී පිරිවෙණෙහි විසූ වනරතන හිමියන් මෘදු කුසලතා සංවර්ධනය කළ ගුරුවරයෙකි (**හංස සංදේශය**, 186). එවැනි ම වනරතන හිමි දක්ෂ විනය පාලකයෙකි (**ගිරා සන්දේශ**, 197). මේ අනුව පැහැදිලි වන්නේ රාජගුරු පදවි ලත් වනරතන හිමියන් සියලු ක්ෂෙත්‍ර මැනවින් දැන සිටි බව යි. තොටගමුවේ විජයබා පිරිවෙණෙහි රාහුල හිමියන් ද මෘදු කුසලතාවලින් යුක්ත වූ අයෙකු බව උන් වහන්සේ තුළ සිල් නැමති සේනාව වූ බවත් කීර්තිය නැමති සෙමර තිබූ බවත් මෛත්‍රිය නැමති ඡත්‍රය ඇති ගුණ නැමති ආභරණයෙන් යුක්ත වූ බවත් කීමෙන් තහවුරු වේ (**ගිරා සන්දේශය**, 247). "මෘදුවචන නැමති විසිතුරු මහ මුහුද" යන යෙදුමෙන් පරෙවි සන්දේශ කතුවරයා රාහුල හිමියන් තුළ පැවති මෘදු කුසලතා පිළිබඳ කියයි. ගිරා සන්දේශ කතුවරයා දක්වන ආකාරයට තොටගමුවේ විජයබා පිරිවෙණෙහි රාහුල හිමියන් පමණක් නො ව එම පිරිවෙණෙහි විසූ සිසුහු ද මෘදුකුසලතාවලින් යුක්ත වූවෝ වූහ. ගස්වලින් වැටුණු ලේන් පැටවුන් රැගෙන සිත්ලෙස ඇඟ සෙමින් අතගාමින් කොළ ගොටුවෙන් දිය පොවමින් අතිනතට ගෙන සිටි කුඩා හිමිවරුන් පිළිබඳ ව ගිරා සන්දේශයේ සඳහන් ය (**ගිරා සන්දේශය, 208**). මිනිසාට පමණක් නො ව ගහ කොළ, සතාසිවුපාවුනට ද මෘදු කුසලතාවන්ගෙන් සංග්‍රහකිරීම තොටගමුවේ හා පද්මාවතී පිරිවෙන්වල විසූ ගුරු සිසු දෙපිරිසට ම අමුතු ප්‍රතිපත්තියක් නො වී ය.

මෙම පිරිවෙණෙහි විසූ  සිසුවෝ මෙන් ම ගුරුවරු ද කාලය නිකරුණේ ගත නො කළහ. කාලය වැය කළේ නම් ඒ ශාස්ත්‍රීය කටයුතුවලට පමණි. සූත්‍ර පිටකයෙහි මෙම කරුණ දැක්වෙන්නේ ධම්මීවා කථා, අරියෝවා තුණ්හීභාවෝ (**නන්දක සූත්‍රය, 2005: 680**) යනුවෙනි. සසුන් මගට පිළිපන් ආර්ය ශ්‍රාවකයෝ රැස් වූයේ නම් ධාර්මික කථාවෙහි ම යෙදිය යුත්තාහ (ධම්මීවා කථා) ධාර්මික කථාවෙහි නො යෙදෙන්නේ නම් නිශ්ශබ්ද ව සිටිම කළ යුත්තාහ (තුණ්හීභාවො). පාසලේ දී හෝ අධ්‍යාපන ආයතනයේ දී ගත කරන හැම නිමේෂයක් ම ශිෂ්‍යයාට ඉතා වැදගත් ය. එහෙයින් කාලය මැනවින් කළමනාකරණය කරගනිමින් උපරිම ඉගෙනුම් අත්දැකීම් ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා ශිෂ්‍යයාට මඟ පෙන්වීම පාසලේ, අධ්‍යාපන ආයතනයේ මධ්‍යාස්ථානයේ කාර්යභාරය විය යුතු ය. සිසු ගැටලු අවම කරගනිමින් ප්‍රජානන, ආවේදන හා මනෝචාලක යන ත්‍රිවිධ ක්ෂේත්‍රවලට අදාළ සිසු නිපුණතා වර්ධනය

කළ හැක්කේ මෙ වැනි පරිසරයක් යටතේ බව කැරගල පද්මාවතී පිරිවෙණේ පැවති අධ්‍යාපන වටපිටාව අපට පසක් කරයි.

**විෂයනිර්දේශ**

තොටගමුවේ විජයබා පිරිවෙණ හා කැරගල පද්මාවතී පිරිවෙණ දෙ ආකාරයක විෂය නිර්දේශ ක්‍රියාත්මක කළ බව පෙනේ. එනම් අලෞකික විෂයමාලාවක් සහ ලෞකික විෂය මාලාවක් යනුවෙනි. අධ්‍යාත්මික පැත්තට බර වූ විෂයන් තුළ දී සිසුවාට අධ්‍යාත්මික ජීවිතය ජයගත හැකි විෂයය කොටස් ඉගෙනුම් අත්දැකීම් ලෙස ලබා දී ඇත (**හංසය සංදේශය,172**). කැරගල පද්මාවති පිරිවෙණෙහි විසූ සාමණේර හිමිවරු සිතේ තබා ගන්නා අයුරින් ඒ ඒ තන්හි හෙරණසික කියති. මෙහි හෙරණසික යනු සාමණේර ශික්ෂාව යි. සාමණේර භික්ෂුවක් ගුරුවරුන් වෙත ගොස් සාමණේර ශික්ෂාවන් පිළිබඳ අසා දැනගැනීම සාමාන්‍ය ක්‍රමය යි. පසු ව ඒවා ගුරුවරයා ඉදිරිපිට කටපාඩමින් කියවයි. හෙරණ සික ප්‍රගුණ කිරිමෙන් අපේක්ෂා කරන්නේ කුඩා සාමණේර හිමිවරුන් මනා හික්මවීමකින් යුතු ව ශාසන බ්‍රහ්මචරියාවෙහි හැසිරවීම වේ. හික්මවීම බෞද්ධ අධ්‍යාපනයේ මූලික පදනම බව "සුසික්ඛිත" (**මංගල සූත්‍රය 2005: 83. 84**) සික්ඛ (**David and Sted, 1966(708)**, "බ්‍රහ්මචරිය" (**සුමංගල විලාසිනිය, 1926: 261**), "විනය" (**සුමංගල විලාසය, 1926: 13**), "සිල" (**පරිනිබ්බාන සූත්‍රය, 2005: 176**)යන වදන් දෙස බැලීමෙන් තහවුරු වේ. වත්මන් පාසල් පද්ධතිය තුළ බොහෝ සිසු ගැටලුවලට හේතුව වී ඇත්තේ විනයට මුල් තැනක් නො දී ලබා දෙන අධ්‍යාපනය යි. හෙරණසික බෞද්ධ අධ්‍යාපනයෙහි විෂය කොටසක් ලෙස ඇතුළත් කොට ඇත්තේ සිසුවා මැනවින් හික්මවීම සඳහා ය(**හංස සංදේශය, 173**). කැරගල වනරතන පිරිවෙණෙහි වසන ශිෂ්‍ය භික්ෂූහු හා ගුරුවරු සිය ප්‍රාණය මෙන් සිල්පද සුරකිති. මෙ මගින් න්‍යාය වශයෙන් ඉගෙන ගන්නා දේ ප්‍රායෝගික ව අත් දුටු අයුරු ප්‍රකාශ වෙයි. ඒ අනුව පැරණි බෞද්ධ අධ්‍යාපන ක්‍රමය න්‍යාය ඉගෙනීම හා ප්‍රායෝගික භාවිතය යන දෙකින් ම යුක්ත වූ බව පෙනේ.

මෙම පිරිවෙන්වල විනය පිටකයට අයත් මුන්සික හා සිඛ වළඳ ඉගෙනගත් බව කියයි. මුන්සික යනු මූල ශික්‍ෂා වේ. එනම් භික්ෂුවක් වශයෙන් මූලික ව දැනගත යුතු ශික්‍ෂා ඇතුළත් පොතක් මෙයින් අදහස් කෙරේ. සිඛ වළඳ යනු දැනට ඉතිරිව ඇති සිංහල භාෂාවෙන් ලියවුණු පැරණිතම විනය කරුණු හා සම්බන්ධ වූ කෘතිය වේ. භික්‍ෂුවක් විසින් පිළිපැදියයුතු ශික්‍ෂා පිළිබඳ මෙහි සඳහන් වේ (**හංස සංදේශය, 175**).

නිශ්‍රය ධර්ම පැරණි අධ්‍යාපනයේ දි ශිෂ්‍යයා හැදෑරූ තවත් වැදගත් විෂය කොටසකි (**හංස සංදේශය,175**). නිශ්‍රය ධර්ම විනිශ්චය යනුවෙන් මෙහි දී අදහස් කරන්නේ උපසපන් භික්ෂුවක් සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන පිළිවෙත් දෙකකි. උපසපන් භික්ෂුවක් උපසම්පදාවෙන් අනතුරු ව පස්වසක් යනතුරු ගුරුවරුන් ඇසුරෙහි හිඳිමින් කිසියම් පිළිවෙත් සමූහයක් සම්පූර්ණ කළ යුතු ය. මේවා නිසබණ නමින් හැඳින් වේ. භික්ෂු ජීවිතය පිරිසිදුව තබා ගැනීමට අවශ්‍ය ප්‍රාතිමෝක්ෂය හා සතර බණවර ප්‍රගුණ කිරීම මෙම අවධියේ දි සිදු වේ. මෙ මගින්

තහවුරු වන්නේ පැරණි ආරාමීය අධ්‍යාපනය තුළ දී සාමණේර අවධියේ දී හෙරණ සික පිළිබඳ ඉගෙන ගැනීමත්, උපසම්පදාවෙන් පසු ව නිස බණ සම්පූර්ණ කිරීමත් සිදු වූ බව යි.

තොටගමුවේ විජයබා හා කැරගල පද්මාවති පිරිවෙන් දෙකෙහි වැඩ විසූ භික්ෂූහු විනය පිටකයෙහි ඇතුළත් කරුණු පරීක්ෂා කරමින් දැනුම වර්ධනය කරත් අයුරු හංස සන්දේශ හා ගිරා සන්දේශ කතුවරු පැහැදිලි කරති (**හංස සන්දේශ, 178-179**), (**ගිරා සන්දේශ, 219-221**). විනය මෙන් ම අභිධර්මයත් මෙම විෂය මාලාව එක් කොටසක් විය (ගැඹුරු විජම් පෙළරුත් අසති සමහරු). සමහර භික්ෂූන් ගැඹුරු අභිධර්ම පාඨවල අදහස විමසා දැනගත් බව කියයි. "ගැඹුරු විජම් පෙළරුත්" යනුවෙන් දක්වා ඇත්තේ එයයි. ගිරා සන්දේශ කතුවරයා තොටගමුවේ විජයබා පිරිවෙන් භික්ෂූන් අභිධර්මය ඉගෙනගත් බව පවසන්නේ "අභිදම් පෙළ අරුත් විමසන සඟ ගණය"යනුවෙනි (**ගිරා සංදේශය,219**).

අභිධර්ම හා විනය යන පිටක දෙකට අමතර ව කැරගල පද්මාවතී පිරිවෙනෙහි විෂය මාලාවට සූත්‍ර පිටකය ද ඇතුළත් ව තිබූ ආකාරය **හංස සන්දේශයේ** 178 වන කවිය තහවුරු කරයි. එහි සඳහන් කරන ආකාරයට ඇතැම් අයෙක් සූත්‍ර පාලි ධර්මය ඇසූහ. මේ සූත්‍ර පාඨ ඉගෙනීමේ අරමුණු කිහිපයක් විය.

1. ස්වර්ග මෝක්ෂ සම්පත්තිය ලබා ගැනීම

2. මිත්‍යාදෘෂ්ටි හැට දෙක මුලින් නුපුටා දමා සම්‍යග්දෘෂ්ටිය ඇති කර ගැනීම

තොටගමුවේ විජයබා පිරිවෙනෙහි විසූ භික්ෂූන් වහන්සේලා සූත්‍ර පිටකය ඉගෙන ගත් අයුරු **ගිරා සංදේශ** කතුවරයා පවසන්නේ මෙසේ ය.

"අතුරුදහන් කෙරෙමින් සිවු අවගුණය
සුතුරු දහම් පවසන සමහර සඟය" (**ගිරා සංදේශය, 220**).

උන් වහන්සේලා ඉගෙන ගන්නා සූත්‍ර ධර්මය සතර අපාය මාර්ගය අන්තර්ධානය කිරීමට උපකාරි විය. මෙම කරුණ මගින් මේ අධ්‍යාපන ක්‍රමය තුළ පැවති ප්‍රායෝගිකත්වය පිළිබඳ තොරතුරු හෙළි කරයි.

හංස සන්දේශ කතුවරයා දක්වන පිළිවෙළ අනුව අභිධර්ම, සූත්‍ර, විනය යන තුනට අමතර ව කැරගල පද්මාවති පිරිවෙනෙහි ව්‍යාකරණ ද උගන්වා ඇත. ව්‍යාකරණ ඉගැන්වීමේ අරමුණ වූයේ පෙළෙහි එන කරුණු මැනවින් අවබෝධ කර ගැනීමට පහසු කිරීම බව හංස සන්දේශ කතුවරයා පවසයි. **න්‍යාස ටීකා විනිශ්චය, කච්චායන වුත්ති** වැනි කෘති ව්‍යාකරණ ඉගැන්වීමේ දී මොවුන් අධ්‍යයනය කර ඇත. ව්‍යාකරණ පාඩම් යටතේ සංඥා, සන්ධි, සමාස, ඉගෙනගත් බව කියැවේ(**හංස සන්දේශය, 174**). වියරණවලට අමතර ව ඡන්දස්, අලංකාර හා තර්ක ශාස්ත්‍ර යන විෂයන් ඉගැන් වූ බව "පවසත් නොයෙක් තකු වියරණ සඳ ලකර" යන්නෙන් කියැවේ.මෙහි "තකු" යනු තර්ක ශාස්ත්‍රය යි. "සඳ" යනු ඡන්දස් වේ. "ලකර" යනු අලංකාර යි.

කැරගල පද්මාවතී පිරිවෙණෙහි ව්‍යාකරණ ඡන්දස්, තර්ක හා අලංකාරණ ඉගැන්වීම සඳහා පැවිදි ගුරුවරු පමණක් නො ව ගිහි ගුරුවරු ද වූහ (**හංස සංදේශය,181**). කාව්‍ය නාටක ශාස්ත්‍ර තවත් විෂයයකි (**හංස සංදේශය,181**). වනරතන හිමි ව්‍යාකරණ මැනවින් දැන සිටි අතර හැම ව්‍යාකරණයක් ම උන් වහන්සේගේ ඥාණ ක්‍රීඩාවට ක්‍රිඩා මණ්ඩලයක් වූ බව කියයි (**හංස සංදේශය,191**) වනරතන හිමි සියලු ව්‍යාකරණ දැන සිටියත් රාහුල හිමියන් දැන සිටියේ ව්‍යාකරණ අටක් පමණක් බව ගිරා සන්දේශ කතුවරයා කියයි (**ගිරා සංදේශය,237**). ව්‍යාකරණවලට අමතර ලෞකික විෂය මාලාවේ කොටසක් ලෙස පුරාණ ඉගැන් වූ බව ගිරා සංදේශය මගින් තහවුරු වේ (**ගිරා සංදේශය, 241**). රාහුල හිමිගේ මෘදු වචන නැමති මහ මුහුද දහ අටක් පුරාණ නමැති රළි සමූහයෙන් නිතර ම පිරුණේ ය. පුරාණ නමින් හැඳින්වෙන පොත් 18ක් වේ. පැරණි සාහිත්‍යයේ වීර කතා, ඉතිහාසය, පුරාවෘත්ත ආදිය මෙහි ඇතුළත් වේ. රාහුල හිමි මෙන් ම වනරතන හිමි ද පුරාණ හදාරා තිබුණ ද වනරතන හිමි ඒවා භික්ෂුවට නොගැළපේ යැයි අත්හළ බව කියැවේ (**හංස සංදේශය, 193**). වනරතන හිමියන් දසට පොරණ ප්‍රතික්ෂේප කිරීමට හේතුව වන්න ඇත්තේ උන් වහන්සේ මහා විහාර සම්ප්‍රදායට ගරු කළ නිසා විය යුතු යි. හංස සන්දේශකතුවරයා හංසයාට කැරගල පද්මාවති පිරිවෙණ දැක මහාවිහාරය දුටුවාක් මෙන් සිත සතුටු කරගන්නා ලෙස පැවසීමෙන් කැරගල පද්මාවතී පිරිවෙණත් මහා විහාරයත් එක ම සම්ප්‍රදායක් ගරු කළ බවට ඉඟි ලබාදෙයි.

දසට පොරණ පමණක් නො ව නැකැත් ශාස්ත්‍රය පිළිබඳ ව ද වනරතන හිමියෝ දැන සිටියහ. නමුත් පුරාණ මෙන් ම නැකැත් ශාස්ත්‍රය ද භික්ෂුවනට තරම් නො වන නිසා අත්හළ බව කියයි (**හංස සංදේශය,193**). නක්‍ෂත්‍රය ඉගැන්වීම ද විජයබා පිරිවෙණහි එක් විෂය කොටසක් වූ බව "ස්වාභාවික තාරකා වැනි බොහෝ බෙල්ලන් රැගෙන නිල් පුවරුයෙහි මැද තැනින් තැන පෙළින් පෙළ තබා තැනින් තැනට වහ වහා අදිමින් ග්‍රහ සංඛ්‍යා ගණනය කොට සමහරු සූර්ය සිද්ධාන්තය ගණන් කරති" යනුවෙන් කරන ප්‍රකාශයෙන් තහවුරු වේ.

මෙමගින් නැකැත් ශාස්ත්‍රය පිරිවෙන් අධ්‍යාපනය තුළ එක් විෂයක් වූ බව සනාථ කරයි. අට්ඨකථා හා ටීකා පිළිබඳ ඉගැන්වීම තවත් විෂයයක් ව පැවතී ඇත. තම ජීවිතය මනාව සකස් කරගත් භික්ෂුහු සිත් වූ පරිද්දෙන් වෙන වෙන ම ප්‍රසිද්ධ අට්ඨ කථා හා ටීකා භාවිත කරමින් විනය පිටකයෙහි ගැඹුරු තැන් අධ්‍යයනය කළ බව ගිරා සන්දේශ කතුවරයා පවසයි. අටුවා ටීකා ඉගෙන ගත්තේ සූත්‍ර හා විනය පිටකයෙහි එන ගැඹුරු තැන් මැනවින් විග්‍රහ කර ගැනීමට ය. ඉගෙන ගන්නා දෙය මතුපිටින් නො ව ගැඹුරින් හැදෑරීම පැරණි අධ්‍යාපන ක්‍රමයේ ලක්ෂණයක් වූ බව මින් සනාථ කරයි.

හංස සංදේශ කතුවරයා සහ ගිරා සන්දේශ කතුවරයා ද තමාට පෙර විසූ විෂය විශාරදයන් පිළිබඳ ව කතා කරයි. හංස සන්දේශ කතුවරයා ඍජු ව ම අනුරපුර යුගයේ විසූ මහාචාර්යවරුන් පිළිබඳ කියයි. ඒ පඬිවරුන්, කච්චායන, මොග්ගල්ලාන, බුද්ධඝෝෂ, ධම්මපාල, මහානාම වැනි අය විය යුතු ය. ගිරා සංදේශ කතුවරයා

ද නිශ්චිත යුගයක් ගැන ප්‍රකාශ නො කළ ද එකල හෝ ඊට පෙර විසූ උගතුන් පිළිබඳ කතා කරයි. සමය අධ්‍යාපනය හා වෛද්‍ය විද්‍යාව ද මේ විෂය මාලාවේ තවත් විෂයයන් දෙකක් වූ බව සනාථ වන්නේ තීක්ෂණ ඥාණයෙන් සැක පසිඳලමින් සමයන්ට අයත් කරුණු එකින් එක දක්වමින් දාන්ත වූ සිතින් යුතු ව විහාරය පුරා වේදයෙහි අර්ථ ධාරණය කරන්නාවූ බ්‍රහ්මණ සමූහයක් විසූ වේ යැයි ගිරා සන්දේශ කතුවරයා කරනු ලබන ප්‍රකාශනයෙනි **(ගිරා සංදේශය,223)**. තොටගමුවේ විජයබා පිරිවෙනෙහි වෛද්‍ය ශාස්ත්‍රය විෂයක් හැටියට ඉගැන් වූ ආකාරය ගිරා සන්දේශ කතුවරයා දක්වයි **(ගිරා සංදේශය,225)**. "පූර්වාචාර්ය ඍෂිවරුන් අනේකාකාරයෙන් ප්‍රකාශ කළ වෛද්‍ය ශාස්ත්‍රය එහි වෙදවරු සතුටින් වනපොත් කරති" යනු ඒ බව දැක්වෙන පද්‍යයෙහි සරල අර්ථය වේ.

ඡන්දස්, අලංකාර, ව්‍යාකරණ, කාව්‍ය නාටක හා මාගධි, සිංහල හා දෙමළ යන භාෂාවන් ද තොටගමුවේ විජයබා පිරිවණේ උගන්වා ඇත. තොටගමුවේ රාහුල හිමියන් ෂඩ්භාෂා පරමේශ්වර යයි කීමෙන් තහවුරු වන්නේ පිරිවෙණෙහි භාෂා හයක් උගන්වා ඇති බව යි **(ගිරා සංදේශය, 245)**. පරෙවි සන්දේශ කතුවරයා රාහුල හිමි භාෂා හයක් දත් බව සනාථ කරන්නේ එහි 208 වන කවියෙනි. සැළලිහිණි සන්දේශ කතුවරයා සිය කෘතියේ 111 වන කවියෙන් මේ බව කියයි.

මෙම තොරතුරු මගින් සනාථ වන්නේ තොටගමුවේ විජයබා පිරිවෙණ, මහායන සම්ප්‍රදාය රැකෙන විෂය මාලාවකුත් කැරගල වනරතන පිරිවෙණ මහා විහාර සම්ප්‍රදාය රැකෙනා විෂය මාලාවකුත් පිරිවෙන් අධ්‍යාපනය තුළ පවත්වාගෙන ගිය බව ය. සමස්තයක් වශයෙන් ගත්විට මෙම පැරණි අධ්‍යාපන ආයතන හුදු මහාවිහාර සම්ප්‍රදාය හෝ අභයගිරි සම්ප්‍රදාය පමණක් නො ව එක් සම්ප්‍රදායන් දෙක ම මිශ්‍ර වූ විෂය මාලාවක් ක්‍රියාත්මක කළ බව නිගමනය කිරීම යුක්ති යුක්ත බව පෙනේ.

**සාරාංශය**

කෝට්ටේ යුගයේ රචිත සන්දේශ කාව්‍යය එකල පැවති අධ්‍යාපන මධ්‍යස්ථාන ගණනාවක් පිළිබඳ තොරතුරු නාමික ව හෙළි කළ ද ඒ හැම එකක් පිළිබඳ ව ම වැඩි දුර විස්තර සඳහන් නො වේ. මෙම සන්දේශ මගින් බොහෝ තොරතුරු ලබාගත හැක්කේ අධ්‍යාපන මධ්‍යස්ථාන දෙකක් ගැන පමණි. ඒ කැරගල පද්මාවතී පිරිවෙණත් තොටගමුවේ විජය බා පිරිවෙණත් යන ආයතන දෙක යි. මෙම පිරිවෙන් දෙක මහායන සම්ප්‍රදායත්, ථෙරවාද සම්ප්‍රදායත් පෝෂණය කළ ආයතන දෙකකි. තොටගමුවේ විජය බා පිරිවණ මහායාන සම්ප්‍රදායට නැඹුරුව ක්‍රියාත්මක අධ්‍යාපන ආයතනයක් වූ අතර කැරගල පද්මාවති පිරිවෙණ ථෙරවාදි සම්ප්‍රදාය අගය කළ අධ්‍යාපන මධ්‍යස්ථානයක් විය. නමුත් මෙම පිරිවෙන් දෙක ම ථෙරවාද, මහායාන යන සම්ප්‍රදායන් ගරු කළ ආයතන ලෙස නම් නොකොට එම සම්ප්‍රදායන් දෙක ම අඩු වැඩි වශයෙන් සම්මිශ්‍රිත ව පවත්වාගෙන ගිය ආයතන ලෙස හඳුනා ගැනීම වඩාත් උචිත ය. ආධ්‍යාපනික මධ්‍යස්ථාන ලෙස ගත් විට මේවා ඉතා ක්‍රමානුකූල ව

හා සංවිධානාත්මක ව පැවතී ඇති අතර ගුරුවරු ද ගුරු කුසලතාවලින් පරිපූර්ණ වූවෝ වූහ. ගුරු සිසු භූමිකා මනාව හඳුනාගත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් මෙකී අධ්‍යාපන ආයතනවල පැවති අතර ගුරු සිසු දෙපිරිස ම මෘදු කුසලතා ප්‍රදර්ශනය වන සේ ඔවුනොවුන්ගේ භූමිකාව ඉටු කොට ඇත. විෂය නිර්දේශය ඉතා පුළුල් පරාසයක විහිදී ගොස් තිබුණු අතර ඒවා ලෞකික හා අලෞකික වශයෙන් දෙ ආකාරයකට ක්‍රියාත්මක වී ඇත. විවිධ ඉගෙනුම් ක්‍රමවේද භාවිත කොට තිබීම මෙම අධ්‍යාපන මධ්‍යස්ථානවල තවත් සුවිශේෂී ලක්ෂණයකි. වර්තමානයේ වැඩි වශයෙන් අගය කරන ප්‍රායෝගික ක්‍රමය වැනි ඉගෙනුම් ක්‍රම ශිල්ප ද මේ අතර දක්නට ලැබේ. ඇතැම්විට වර්තමානයේ අඩු ඵලදායිතාවක් ඇතැයි පසෙක ලා ඇති ඇතැම් ඉගෙනුම් ක්‍රම පැරණි අධ්‍යාපනය තුළ වඩා ඵලදායී ව ප්‍රගුණ කොට තිබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය


අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. (2014). **ගිරා සන්දේශය.**

**අංගුත්තර නිකාය. නන්දක සූත්‍රය.** (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. නැදිමාල:

**දීඝනිකාය මහා පරිනිබ්බාන සූත්‍රය.** (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. නැදිමාල:

**පරවි සංදේශය** (2015). (සංස්). ලියනාරච්චි, ආර්. ඩී. සමයවර්ධන පොත්හල. කොළඹ:

**සැළලිහිණි සංදේශය.** (1974). (සංස්). ලයනල් ලොකුලියන. ගුණසේන පොත්හල. කොළඹ:

**සුත්ත නිපාතය. මංගල සූත්‍රය.** (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. නැදිමාල:

**සුමංගල විලාසිනී.** (1926). සයිමන් හේවාවිතාරණ මුද්‍රණ.

**හංස සන්දේශය.**(2015). (සංස්).සේනානායක. ජී. එස්. ඩී. ප්‍රදීප් මුද්‍රණය.


### ද්විතීයික මූලාශ්‍රය


අධිකාරි, අභයරත්න. (1991). **ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා මහ සඟ ගණ.** එස් ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ:

අබේසිංහ, ඩබ්ලිව්. (1999). **පැරණි ශ්‍රී ලංකාවේ ආරාම අධ්‍යාපනය.** විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය. මුල්ලේරියාව:

පුඤ්ඤසාර, ජී. (1991). **තොටගමුවේ පින්බිම.** සම්භාෂා පළමු වෙළුම. තෙවන කලාපය අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය. නව සමගි මුද්‍රණාලය. කොළඹ:

ලොකුලියන, එල්. (1974). **සැළලිහිණි සන්දේශය.** ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ:

වීරතුංග, එන්. (1981). **අධ්‍යාපන මූලධර්ම.** අධ්‍යාපන නිතිය හා පරිපාලනය. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ. මරදාන:

David, R.E Sted. (1966). **English Dictionary**. Pali Text Society.